## බළන්ගොඩ නගර සභාව

## 2025.11.21 දිනැති විශේෂ මහා සභා රැස්වීම් වාර්තාව

**ස්ථානය** **- බළන්ගොඩ නගර සභා රැස්වීම් ශාලාව**

**දිනය** **- 2025.11.21**

**වේලාව** **-පෙ.ව. 10.00**

**බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමාගේ ප්‍රධානත්වයෙන් මෙදින විශේෂ මහ සභාවේ කටයුතු පවත්වන ලදී.**

**සහභාගීත්වය**

| | |
|---|---|
| 1. ගරු සභාපති | කේ. ජී පේමදාස මැතිතුමා |
| 2. ගරු උප සභාපති | පේෂල නිකලන්ද මැතිතුමා |
| 3. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඒ.වසන්ත ගුණරත්න මැතිතුමා |
| 4. ගරු නාගරික මන්ත්‍රී | එම්.ටී.එම් රූමි මැතිතුමා |
| 5. ගරු නාගරික මන්ත්‍රී | එම්.නිමල් කරුණාරත්න මැතිතුමා |
| 6. ගරු නාගරික මන්ත්‍රී | එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා |
| 7. ගරු නාගරික මන්ත්‍රී | එම්.ඩබ්.විමලසිරි මැතිතුමා |
| 8. ගරු නාගරික මන්ත්‍රී | නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා |
| 9. ගරු නාගරික මන්ත්‍රීනී | සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය |
| 10. ගරු නාගරික මන්ත්‍රීනී | පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය |
| 11. ගරු නාගරික මන්ත්‍රී | එන්.ඒ.එස් චන්දන මැතිතුමා |
| 12. ගරු නාගරික මන්ත්‍රී | ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා |
| 13. ගරු නාගරික මන්ත්‍රී | එස්.යූ.සී. ජයනක මැතිතුමා |
| 14. ගරු නාගරික මන්ත්‍රී | එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා |
| 15. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා |
| 16. ගරු නාගරික මන්ත්‍රී | ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා |

**නිළධාරි සහභාගීත්වය**

1. ලේකම් එස්. එච්. ඒ. කරුණාරත්න මිය

2.ගණකාධිකාරී එම්.ජී.එස් ගුණවර්ධන මිය

මෙදින විශේෂ මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 10.00 ට ආරම්භ කළ ගරු සභාපතිතුමන් විශේෂ මහ සභාව සඳහා සහභාගී වූ ගරු නාගරික මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා සහ සභාවේ ලේකම්තුමිය ඇතුළු කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදීන් පිරිස පිළිගත් අතර, ආගම සිහි කිරීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන බව ප්‍රකාශ කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමන් පැවසුයේ බස් නැවතුම්පොළ පරිශ්‍රයේ පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරීමේ කර්මාන්තය සඳහා clean sri lanka වැඩසටහන යටතේ අරමුදල් ලැබුන බවත්, බස් නැවතුම්පොළ පොදු වැසිකිළි පද්ධතියේ මේ වන විට විශාල අඩුපාඩු රාශියක් පවතින බවත් , වැසිකිළි උපකරණ අබලන් වී ඇති බවත්, ගලි බවුසරය දිනකට දෙවතාවක් යෙදවීමට සිදුවීම හේතුවෙන් එයින්ද සභාවට ආදායමක් අහිමිවන බවත්, එම කර්මාන්තයේ වැඩ කටයුතු මේ වර්ෂය තුළදී අවසන් කළයුතු බවත්, ඊට අදාළ අභියාචනා කමිටු තීරණය ලැබී ඇති බැවින් අදදින විශේෂ මහ සභාවේ ඒ සඳහා අනුමැතිය ලබා දුනහොත් එම කර්මාන්තය කොන්ත්‍රාත්කරුවන්ට පිරිනැමීමට හැකි බවත් හැකි ඉක්මනින් කර්මාන්තයේ වැඩ කටයුතු නිමා කර ගැනීමට හැකි වනු ඇති බවත්, ඒ අනුව ඊට සහයෝගය ලබා දෙන ලෙසත් පවසන ලදී.

න්‍යායපත්‍රානුකූලව 2026 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සඳහා අනුමැතිය ලබා ගැනීම පළමුව සිදු කිරීමට තිබුනද ඒ සඳහා කාලයක් වැය වන බැවින් සභාවේ කටයුතු පහසුවීම උදෙසා න්‍යාපත්‍රයේ අංක 02 සඳහා පළමුව අනුමැතිය ලබා ගැනීම සුදුසු බව ගරු සභාපතිතුමන් විසින් පවසන ලදී.

**01. බළන්ගොඩ මහජන බස් නැවතුම්පොළ පරිශ්‍රයේ ඇති පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරීමේ කර්මාන්තයට අදාළ අභියාචනා කමිටු තීරණය සඳහා අනුමැතිය ලබා ගැනීම.**

ඉහත කර්මාන්තයට අදාළව අභියාචනා කමිටුව විසින් නිර්දේශ කරන ලද පහත සඳහන් තීරණය ගරු සභාපතිතුමන් විසින් ගරු සභාවට ඉදිරිපත් කරන ලදි.

- ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය 2024 විධිවිධාන සහ පටිපාටිවලට අනුකූලව ලංසු ඇගයීමේදී අරමුණ වන්නේ සාරානුකූලව අවම ලංසුව ඉදිරිපත් කර ඇති කොන්ත්‍රාත්කරු වෙත ලංසුව

පිරිනැමීමය.ඒ අනුව මෙහිදී සාරානුකූලව ප්‍රතිචාර දක්වා ඇති එකම ලංසුකරු වන්නේ සැම් ඩැම් ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වේ.

- එබැවින් සැම් ඩැම් ඉංජිනියරින් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් (ප්‍රයිවට්) ලිමිටඩ් වෙත බළන්ගොඩ මහජන බස් නැවතුම්පොළ පරිශ්‍රයේ ඇති පොදු වැසිකිළි පද්ධතිය වැඩි දියුණු කිරීමේ කොන්ත්‍රාත්තුව ප්‍රදානය කිරීම ගැටලුකාරී නොවන බවත්,ඒ මගින් රජයට මූල්‍යමය අලාභයක් සිදු නොවන බවත් අභියාචනා කමිටුව විසින් තීරණය කරන ලදී.

මෙහිදී ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා, උපරිම ලංසු මුදල ඉදිරිපත් කර ඇත්තේ සැම් ඩැම් ආයතනයෙන්ද යන්නත්,තවත් ලංසුකරුවන් දෙදෙනෙකු ඒ සඳහා ඉල්ලුම් කළද ඔවුන් ප්‍රතික්ෂේප කිරීමට අදාළ හේතුන් එම වාර්තාවෙන් දක්වා තිබේද යන්නත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා එම ටෙන්ඩරයට ඉල්ලුම් කළ අනෙකුත් ලංසුකරුවන් විරෝධය දැක්වූවාද යන්නත් විමසන ලදී.

ගරු සභාපතිතුමා පැවසූයේ තාක්ෂණික ඇගයීම් කමිටුව මගින් සැම් ඩැම් ආයතනය තෝරා පත්කර ගැනීමට සහ අනෙකුත් ලංසුකරුවන් ප්‍රතික්ෂේප කිරීමට හේතු දක්වා ඇති බවත්, අනෙකුත් ලංසුකරුවන්ගේ විරෝධතා හේතුවෙන් අභියාචනා කමිටුව පැවැත්වූ බවත්ය.

ඒ අනුව අභියාචනා කමිටුව විසින් නිර්දේශ කරන ලද ඉහත තීරණය ගරු සභාපතිතුමන් විසින් සභාවට ඉදිරිපත් කරමින් ගරු සභාවේ අනුමැතිය ලබාදීම සුදුසු බවට කළ යෝජනාව ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදුව විරෝධතා නොවූ හෙයින් ගරු සභාවේ ඒකමතිකව සම්මත විය.

පෙ.ව.10.19ට ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය සභාවට පැමිණෙන ලදී.

### 02. 2026 වර්ෂය සඳහා වූ අයවැය කෙටුම්පත සඳහා අනුමැතිය ලබා ගැනීම.

ගරු සභාපතිතුමන් විසින් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධිවිධාන) පනතට අනුව බළන්ගොඩ නගර සභාවේ 2026 වර්ෂයට අදාල සංශෝධන ඇතුලත් කරමින් සකස් කළ අය වැය යෝජනාවලිය ගරු සභාවට ඉදිරිපත් කළ අතර, ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා විසින් එම අයවැය යෝජනාවලිය ස්ථිර කරන ලදී.

අනතුරුව ගරු සභාපතිතුමන් විසින් 2026 වර්ෂයේ අයවැය කතාව සභාවට ඉදිරිපත් කරන ලදී.

අයවැය කතාව ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ගරු සභාපතිතුමා අදහස් දක්වමින් 2012 අංක 21 දරණ පළාත් පාලන ආයතන (විශේෂ විධි විධාන) පනතට අනුකූලව බළන්ගොඩ නගර සභාවේ 2026 වර්ෂයට

අදාල අයවැය යෝජනාවලිය තමන් විසින් සභාගත කළ අතර, එම අයවැය යෝජනාවලියට සංශෝධන හෝ එකතු කිරීම් , සුළු වෙනස් කිරීම්, ප්‍රතික්ෂේප කිරීම් පවතින්නේ නම් ඉදිරිපත් කරන ලෙස පවසන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා අදහස් දක්වමින් පවසා සිටියේ 2026 අයවැය ප්‍රකාශයෙහි, පුනරාවර්තන ආදායම රු.217,534,000ක් ලෙසත් , පුනරාවර්තන වියදම රු.194,214,000ක් ලෙසත්, අතිරික්තය රු.5000 ක් ලෙසත් දක්වා ඇති බවත්, අයශිර්ෂයේ 310 සිට 380 දක්වා ආදායම් ලැබෙන ආකාරය දක්වා ඇති බවත්,වියදම් ශිර්ෂ 510 සිට 550 දක්වා වියදම් දරන ආකාරය දක්වා ඇති බවත්, ඉන්පසුව වැඩසටහන් පිළිවෙලින් පොදු පරිපාලන හා කාර්යමණ්ඩල සේවා,සෞඛ්‍ය සේවා, භෞතික සැලසුම් කිරීම් මංමාවත් ඉඩම් හා ගොඩනැගිලි, වෙනත් මහජන අර්ථකාරී සේවා, සුභ සාධක සේවා හා පහසුකම් ලෙස වියදම් දරන ආකාරය පෙන්වා ඇති බවත්,

නමුත් මෙම අයවැය ලේඛනයේ යම් යම් අඩුපාඩු ප්‍රමාණයක් තමන් දකින බවත්,ඒ අතරින් පිටු අංක 08හි අය ශිර්ෂ 20362 (iii) යටතේ, ප්‍රතිචක්‍රීයකරණය කරන ලද පොලිතීන් විකිණීමෙන් 2025 සැප්තැම්බර් වන විට ආදායම රු.287,000ක් ලබා ඇති වුවද 2026 වර්ෂයේ රු.1,000,000ක් ඇස්තමේන්තුගත කර ඇති බවත්, අය ශිර්ෂ 50322 (ii) යටතේ සහ 50322 (ii) යටතේ දක්වා ඇති කුලී මුදල් 2025 වර්ෂයේ ඇස්තමේන්තුගත ආදායමේ අගයම 2026 වර්ෂයේද දක්වා ඇති බවත්, එම කුලී මුදල් වැඩිවීමක් සිදු නොවන්නේ ඇයිද යන්නත්, වැය ශිර්ෂ 65473 නිවාස ආධාර සහ වැසිකිළි ආධාර යටතේ මින් පෙර අයවැය ලේඛනයන්හි මුදල් වෙන් කිරීමක් සිදු වුවද 2026 වර්ෂයේ අයවැය මගින් කිසිඳු මුදලක් ඒ වෙනුවෙන් වෙන්කර නොමැති බවත්, නගරයේ වීථි ජනතාව ජීවත්වන බවත් එම පුද්ගලයෙක් මැරී වැටුනත් එම කටයුතු වෙනුවෙන් කිසිඳු මුදලක් වෙන්කර නොමැති බවත්, එවැනි අඩුපාඩු රාශියක් අයවැය තුළ දක්නට ලැබෙන බැවින් මෙම අයවැය කෙරෙහි අනෙකුත් මන්ත්‍රීතුමන්ලාගෙනුත් අදහස් විමසීමක් සිදු කර අයවැය විවාදයක් පැවැත්වීමට යෝජනා කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

මෙහිදී ගරු සභාපතිතුමා ඉහත ගැටළු වලට පිළිතුරු ලබා දීම සඳහා ගණකාධිකාරීතුමියගෙන් කරුණු විමසීම වෙනුවෙන් මහ සභාව කාරක සභාවක් බවට පත් කිරීමට යෝජනා කිරීමේදී ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා පැවසූයේ, ගරු සභාපතතිතුමාගේ අයවැය පිළිබඳව විමසීම් කිරීමේදී සභාපතිතුමා ඊට පිළිතුරු ලබා දිය යුතු බවයි.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා අදහස් දක්වමින් පැවසූයේ ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා ඉදිරිපත් කළ ප්‍රශ්නවලට ගරු සභාපතිතුමා පිළිතුරු ලබා දිය යුතු බවත්,

ගණකාධිකාරීතුමිය යනු බළන්ගොඩ නගර සභාවේ වැඩබලන නිලධාරීවරියක බවත් එතුමිය යම් ස්ථානමාරුවක් වී ගියොත් මෙම අයවැය වෙනුවෙන් එහිදී පිළිතුරු ලබා දිය යුත්තේ ගරු සභාපතිතුමා බවත්, කාරක සභා කරමින් නිලධාරීන්ගෙන් පිළිතුරු ලබා දීම නොව බළන්ගොඩ නගර සභාවේ ගරු සභාපතිවරයා ලෙස අයවැය වැනි වැදගත් ලේඛන පිළියෙළ කිරීමේදී ඒ පිළිබඳ ගරු සභාපතිතුමා හොඳින් දැනුවත් විය යුතු බවත්, 2026 වර්ෂයේදී නගරයේ සිදුකරන සංවර්ධන කටයුතු, පරිපාලන කටයුතු ආදීය පිළිබඳව අවබෝධයකින් කටයුතු කළ යුතු බවත්, රජයේ නිලධාරින් වෙත ඕනෑම වේලාවක ස්ථානමාරු ලැබිය යැකි බැවින් කාරක සභා වාර කරමින් එතුමන්ලාගෙන් පිළිතුරු ලබා දීම් නොව සභාපතිවරයා ලෙස පිළිතුරු ලබා දීමට බැඳී සිටින බවත්, මෙවර අයවැය පැරදුනද සභාපතිතුමාට එය ගැටළුවක් නොවන බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා අදහස් දක්වමින් "පිටුව පෙරලුවට සීතා පොත දන්නවා රාමා" යනුවෙන් ප්‍රකාශයක් ඇති බවත්, මෙහි සීතා නොමැති වුවත් යම් කෙනෙකු සිටින බවත්, මෙම ආයතනයේ ප්‍රධානියා වන්නේ සභාපතිවරයා බවත්, මෙම අයවැය ප්‍රකාශයේ පළමුවෙනි පිටුවෙන්ම මෙය අනාගෙන ඇති බවත්, ප්‍රධානියා ලෙස සභාපතිවරයාගේ නම මුලින්ම පැමිණිය යුතු බවත්, ඊළඟට ලේකම්, ගණකාධිකාරී නම් පැමිණිය යුතු බවත්, නමුත් මෙහි මුලින්ම ගණකාධිකාරිගේ නම ඇතුළත් කර ඇති බවත්, මෙය කලාපයේ අයවැයක් ලෙස සකස් කර ඇති බවත්, කලාපයේ අයවැය එතුමිය නිවරදි ලෙස පිළියෙළ කරනවා ඇති බවත්, නම්ද සිංහල හා ඉංග්‍රීසි බසින් ලිවීමේදී වැරදි ඇති බවත්, මේවා කිසිඳු අයෙකු පරීක්ෂා කර නොමැති බවත්, වැරදි වලට වගකියන්නේ කව්ද යන්නත්, සභාපතිවරයාගේ අයවැය සභාපතිවරයාගේ වගකීම බවත් පැවසීය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින්, පසුගියදා පැවති අයවැය සාකච්ඡාවේදී පැමිණි සභිකයන් කතා කළද සභාපතිතුමා ඊට අදහස් දැක්වීම් සිදු නොකළ බවත්, සභාපතිවරයා ලෙස අයවැය පිළිබඳව මැදිහත්වීම හා දැනුවත්වීම ඉතා දුර්වල බවත්, පිටකවරයෙන්ම අනාගත්ත අයවැයක් ජනතා විමුක්ති පෙරමුණේ ප්‍රධාන සභාව ඉදිරිපත් කර ඇති බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන් හෙට්ටිආරච්චි මැතිතුමා අදහස් දක්වමින් අයවැය ලේඛනයක් යනු ආදායම් ලබා ගැනීම සහ වියදම් කරන ආකාරය දැක්වීමක් බවත්, මෙම අයවැය ප්‍රකාශය අනුව පුනරාවර්තන ආදායම ලෙස මිලියන 217ක් සහ පුනරාවර්තන වියදම ලෙස මිලියන 194 ක් දක්වා ඇති බවත්, නමුත් පුනරාවර්තන වියදම් අඩු කිරීමට කිසිඳු උත්සහයක් දරා නොමැති බවත්, ප්‍රාග්ධන වියදම ලෙස වෙන් කර ඇත්තේ මිලියන 26 ක් බවත්, එවිට මාසයකට සභිකයෙකුට වෙන් වන්නේ රු. 137,395ක් වැනි මුදලක් බවත්, ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමාද පැවසූ පරිදි පාරේ

පුද්ගලයෙක් මැරුනත් ඔහුව වළදාන්නවත් කිසිඳු මුදලක් සභාව වැය කරන්නේ නැති බවත්, ඉන්ධන වියදම මාසයකට විහාල අගයක් ගන්නා බවත්, ඒවා කළමනාකරණය කිරීමට කිසිඳු පියවරක් ගෙන නොමැති බවත්, ස්ථිර සේවකයන් සිටියදී දෛනික වැටුප් වෙනුවෙන් වර්ෂයකට මිලියන 19ක් නිෂ්කාරනේ වැයකරන බවත්, සෞඛ්‍ය කම්කරුවන් වැඩ ක්ෂේත්‍ර කම්කරුවන් ආදීන් නියමිත තනතුරේ යෙදවීමට පුන පුනා ප්‍රකාශ කළ බවත්, නමුත් ඒ සම්බන්ධයෙන් ක්‍රියාමාර්ග ගෙන නොමැති බවත්, මේ සම්බන්ධව බලවත් අප්‍රසාදය පළ කරන බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය**

ගරු නාගරික මන්ත්‍රීනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය තම අදහස් දක්වමින් 54%ක් වන බල ප්‍රදේශයේ කාන්තාවන් වෙනුවෙන් කිසිඳු මුදලක් මෙම අයවැය මඟින් වෙන්කර නොමැති බවත්, නිවාස ආධාර සහ වැසිකිළි ආධාර වැනි සමාජ සුභසාධන කටයුතු වෙනුවෙන් මෙම අයවැය මඟින් කිසිඳු ප්‍රතිපාදනයක් වෙන් කර නොමැති බවත්, කාන්තාවක් ලෙස කාන්තාවන් වෙනුවෙන් කිසිඳු ප්‍රතිපාදනයක් වෙන් නොකිරීම සම්බන්ධව කණගාටුව ප්‍රකාශ කරන බවත් පවසමින් එතුමියගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රූමි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් පැවසුයේ මෙම අයවැය සකස් කර ඇත්තේ 20%ක වැටුප් ප්‍රතිපූර්ණය අඩුකර බවත්, නමුත් ඉදිරියේදී 40%ක් වැටුප් ප්‍රතිපූර්ණය නොකරන බව සභාපතිතුමා පැවසූ බවත්, එසේනම් මෙම අයවැය සම්පූර්ණයෙන් වැරදි බවත්, 40%ක් වැටුප් වෙනුවෙන් වෙන් කිරීමට සිදුවුවහොත් කළ යුතු විකල්පය කුමක්ද යන්න තීරණය කර නොමැති බවත්, මින් පෙර වර්ෂවලදී සභාවේ අයවැය මඟින් සමාජ සුභසාධන ලෙස වැසිකිළි ආධාර, නිවාස ආධාර, ශිෂ්‍යාධාර ආදී ලෙස මුදල් වෙන් කළද 2025 වර්ෂයේදීද එම ආධාර ලබා නොදුන් බැවින් 2026 දී එය ලබා දෙනවා යන්න සුරංගනා කතාවක් බවත්, මෙම අයවැය මඟින් ඒවා සියල්ල කප්පාදු කර ඇති බවත්, 2025 වර්ෂයේ මුද්දර ගාස්තු ලෙස කෝටියක පමණ මුදලක් ලැබී ඇති බවත්, එම මුදල්ද ඇතුළත් කරමින් මෙම 2026 වර්ෂයේ අයවැය පිළියෙළ කර ඇති බවත්, සභාපතිතුමාටද පෙර සභාවලදී පක්ෂ බේදයකින් තොරව එම ආධාර ලබාගත් බවත්, අහිංසක දුප්පත් ජනතාව එම ආධාර මඟින් ප්‍රතිලාභ ලබා ගත් බවත්, 40% වැටුප් ප්‍රතිපූර්ණය නොකරන තත්වය උදාවුවහොත් කිසිඳු මන්ත්‍රීවරයෙකුට කිසිඳු සංවර්ධන කටයුත්තක් වෙනුවෙන් මුදල් ලබා ගැනිමේ හැකියාවක් නොලැබෙනු ඇතැයිද පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදි.

ගරු සභාපතිතුමා මෙහිදී පැවසුයේ මෙය පොදුවේ සියළුම පළාත් පාලන ආයතනවලට බලපානු ලබන කාරණාවක් බවත්, ආණ්ඩුකාරතුමිය සමඟද මේ පිළිබඳව සාකච්ඡා කළ බවත්, පළාත් පාලන ආයතනවල අරමුදල වෙත ප්‍රදාන මුදලක් ලබා දෙනු ඇති බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා නැවතත් අදහස් දක්වමින් ලබා දෙනු ලබන යෝජනා ක්‍රියාත්මක කරවීමට ආදායම් මාර්ග ඇතිකරවීමට කාගේත් යුතුකමක් පවතින බවත්, 2023 වර්ෂයේ වසන්ත සභාපතිතුමාගේ කාලයේ බළන්ගොඩ තානායම මඟින් ලක්ෂ 85 ක ආදායමක් ලබා ඇති බවත්, මන්ත්‍රී ප්‍රතිපාදන ලෙස ලක්ෂ 140ක් ලබා දුන් බවත් , නමුත් තානායම පිලිබඳ සාකච්චා කළද ඒ පිළිබඳ ඵලක් නැති වී ඇති බවත්, IMF කොන්දේසි ක්‍රියාත්මක කරන බවත්, මෙම අයවැය ප්‍රසාරණයක් නොව එන්න එන්නම හැකිළිමක් සිදු වී ඇති බවත්, කලින් ඩොලරයට සාපේක්ෂව දැන් ඩොලරයේ මිලද වැඩි වී ඇති බැවින් මුදල් ගොඩගැසී තිබිය යුතු බවත් පැවසීය.

ගරු සභාපතිතුමා පැවසූයේ ලංකාවේ විශාල ආර්ථික අර්බුයක් තිබූ බවත්, මෙම රජය භාරගත්තේ විශාල වශයෙන් වැටුනු රටක් බවත්, නමුත් IMF කොන්දේසි එවකට සිටි රජයන් සමයේ ඇතිකරගත් ගිවිසුම් බවත්, නමුත් එයින් පිටපැනීමක් සිදු කර වැඩකළ නොහැකි බවත්, මෙම තත්වයට හෝ රට ගෙන ඒමට ඒවාට අනුගත වීමට සිදුවන බවත්, 2019 ලංකාවේ තිබූ ආර්ථිකයට සමාන ආර්ථිකයක් දැන් රටතුළ නිර්මාණය වෙමින් පවතින බවත්, ඉදිරි කාලය තුළ මේ රට මීටත් වඩා පෙරට රැගෙන යාමට හැකියාව ලැබෙනු ඇතැයිද , මේ වන විට මත් උවදුර සම්පූර්ණයෙන්ම පාහේ මර්දනය කර ඇති බවත්, මෙම රජය බාරගත්තේ බිංදුවට වැටුනු රටක් බැවින් එය පොදුවේ සියල්ලන්ටම බලපානු ලබන බවත් බළන්ගොඩ නගර සභාවටද එයින් මිදීමට හැකියාවක් නොමැති බවත්, අයවැය තුළින් වැසිකිළි ආධාර වැනි සුභසාධන සේවා ගැලපීම් කිරීමට උපරිම උත්සහ කළ බවත්, ඉදිරියේදී මෙම අයවැය තුළට ඇතුළත් කළත් නැතත් ඒවාට පක්ෂ පාට බේදයකින් තොරව එම ප්‍රතිලාභ ලබා දිමේ හැකියාවක් තිබේනම් ඒ පිලිබඳ සලකා බලනු ලබන බවත්, රජයේ අයවැය පවා ඒ ආකාරයෙන්ම ක්‍රියාත්මක කිරීමක් නොකරන බවත්ය.

ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා පැවසූයේ ගරු නාගරික මන්ත්‍රීනී තරංගනී මන්ත්‍රීතුමියගේ මවගේ අභාවය වෙනුවෙන් ශෝකය පළ කරන බවත් අදදින එතුමියගේ දානමය පිංකම යෙදී ඇති බැවින් එතුමිය එහි සිටිය යුතු බවත් නමුත් සභාව වෙත පැමිණ ඇති බවත් පැවසූ අතර ගරු නාගරික මන්ත්‍රී ඒම්.ටී.ඒම් රූමි මැතිතුමා පැවසූයේ එතුමියගේ මවගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන බවත්, නව දෙනෙකුගේ අත්සනින් යුතුව අදදින සභාව කල් දැමීමට සභාපතිතුමාට ලබා දුන්නද සභාපතිතුමා ඒ පිළිබඳ මනුෂ්‍යාත්වයෙන් සලකා නොබැලූ බවත්, සභාපතිතුමාගේ බලතල යටතේ සභාව කල් දැමීමේ හැකියාව පැවති බවත්, අදදින අයවැය සම්මත වූවත් නොවූවත් සභාපතිතුමාට මෙම අයවැය සම්මත වූවා සේ සැලකිය හැකි බවත්ය.

ගරු සභාපතිතුමා පැවසුයේ එතුමියගේ මවගේ අභාවය පිළිබඳව ශෝකය පළ කරන බවත්, දානමය පිංකම වෙනුවෙන් සහභාගී වීමට නොහැකි වීම පිළිබඳව කණගාටුව ප්‍රකාශ කරන බවත්, අඳදින සභාව පැවැත්වීම අත්‍යවශ්‍ය කාරණාවක් වූයේ බස් නැවතුම්පොළ පොදු වැසිකිළි පද්ධතිය සම්බන්ධ තීරණය දවසක්වත් ප්‍රමාද කිරීමේ හැකියාවක් නොතිබූ බැවින් බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා අදහස් දක්වමින් තරංගනී මන්ත්‍රීතුමියගේ මවගේ අභාවය පිළිබඳ ශෝකය පළ කරන බවත්, අයවැය ප්‍රකාශයේ සභාපතිතුමගේ නම තිබිය යුතු ස්ථානය පිළිබඳව සභාපතිතුමා තීරණය කළ යුතු බවත්, එය තිබිය යුතු ස්ථානයේ නොතිබීමෙන් සභාපතිතුමා අගතියක් කර ගෙන ඇති බවත්, අයවැය විවාදයේදී විමලසිරි මන්ත්‍රීතුමා අසනු ලැබූ ප්‍රශ්න වලට සභාපතිතුමාට පිළිතුරු ලබා දීමේ හැකියාව පැවති බවත්, එසේ අසනු ලැබූ කඩ කුළී සම්බන්ධ ගැටළුවට පිළිතුර වන්නේ වර්ෂ තුනක කාලයකට කඩකුලී තක්සේරුව වලංගුව පවතින බැවන් කඩ කුලී වැඩිවීමක් සිදු නොවන බව පැවසිය හැකිව තිබූ බවත්, සභාපතිතුමා එම කරුණු පිළිබඳව සූදානමකින් සිටිය යුතු බවත්, මෙම අයවැයට ඡන්ද විමසීමක් සිදු කළ හොත් සභාපතුමාට පත්ෂව ඡන්දය ලබා දෙන බවත්, නමුත් මෙහි වැරදි අඩුපාඩු දැකිය යුතු බවත්, මෙම සභාවේ ක්‍රියාකලාපය පිළිබඳව සභාවේ කිසිවෙකු සතුටු නොවන බවත්, මෙය මන්දගාමී සභාවක් බවත්, අයවැය වැනි කාරණාවලදී සභාපතිවරයා ලෙස මීට වඩා සූදානමක් තිබිය යුතු බවත් පැවසීය.

එතුමා වැඩිදුරටත් අදහස් දක්වමින් පැවති දිස්ත්‍රික් සම්බන්ධීකතරණ කමිටු රැස්වීමේදී ගරු ජනාධිපතිතුමාට වැටුප් ප්‍රතිපූර්ණය පිළිබඳ ගැටළුව ඉදිරිපත් කළ හැකිව පැවති බවත්, 2026 වර්ෂයේදීවත් සභාවේ පවත්නා ඇල් මැරුණ ස්වභාවය ඉවත්කරන ලෙසත්, සමාජයේද මෙම සභාවේ ක්‍රියාකාරිත්වය පිළිබඳ ලොකු විවේචනයක් පවතින බවත්, කොමසාරිස් පාලන කාලය තුළදී පවා මෙම සභාව මීට වඩා ඉදිරියෙන් සිටි බවත්, මෙම වාරයේදී අයවැයට සහයෝගය ලබාදෙන්නේ සභාපතිතුමා ඉදිරියට අඩුපාඩු නිවරදි කරගනීවි යන විශ්වාශයෙන් බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

**ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ වසන්ත ගුණරත්න මැතිතුමා නැවතත් අදහස් දක්වමින් පැවසුයේ මෙම අයවැය දිනුවත් පැරදුනත් සභාපතිතුමාට අයවැය සම්මත වූවාසේ සැලකීමෙන් කටයුතු කළ හැති බවත්, නමුත් වැරදි අඩුපාඩු පෙන්වා දීම යුතුකම මෙන්ම වගකීම බවත්, 2022 හා 2023 වැනි වර්ෂවල අයවැය හා සැසඳීමේදී මෙම අයවැය තුළින් මහජන සේවාව ලබා දිය යුතු සේවාවන් වලින් කෝටි 28 ක පමණ කප්පාදුවක් කර ඇති බවත්, සභාවේ මෙතෙක් හිටපු සභාපතිවරුන්ගෙන් දැනට සිටින සභාපතිතුමාට හොරෙක් වංචාකාරයෙක් බොරුකාරයෙක් නොවන බැවින්ද මානුෂීය බැවින්ද ගරු කරන බවත් පවසන ලදී.

තමා මෙන්ම මෙම සභාවේ බොහෝ මන්ත්‍රීතුමන්ලා පන්සල් සමඟ සම්බන්ධ බවත්, තමාගේ පාලන කාලවලදී පොහෝ දිනයන් වලදී තලාවේ පන්සලට ජල බවුසරය මෙන්ම අවශ්‍ය අවස්තාවලදී පන්සල් වලට ගලි බවුසරය ලබා දුන් බවත්, මෙම සභාවෙන් එම කිසිඳු දෙයක් නොදන බවත්, එමෙන්ම පාසල් වලට ක්‍රීඩාංගණය නොමිලේ ලබා දුන් බවත් , කෝවිල් වලට ට්‍රැක්ටර් රථ මෙන්ම පාර සේදීමට ජල බවුසරය පවා නොමිලේ ලබා දුන් බවත්, වෙසක් උත්සවය වෙනුවෙන් ලක්ෂ 15ක් වෙන් කළ බවත්, නමුත් දැන් පන්සලට, පල්ලියට,කෝවිලට, පාසලට  යාමට නොහැකි තත්වයක් ඇති වී ඇති බවත්, මිනිසුන්ට සේවා සපයන ආයතනයක් ලෙස ආදායම් උත්පාදනය සේම ජනතාවට ලබා දෙනු ලබන සේවා පිළිබඳ සැලකිලිමත් විය යුතු බවත්, ක්‍රීඩා පිටිය සම්බන්ධ කටයුතු සඳහා වෙන්කර ඇත්තේ රු.5000ක් බවත්, තුරු උයන වෙත තමාගේ අයවැය තුළින් ලක්ෂ 700 ක් පමණ වෙන් කළද මෙම අයවැය තුළින් එම නමවත් නැති බවත්, මෙවැනි අයවැයකට ඡන්දය ලබා දිය නොහැකි බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදි.

ගරු සභාපතිතුමා මෙහිදි පැවසුයේ මෙම අයවැය සකස් කර ගැනීම පවා ඉතාම අසීරු වූ බවත්, ක්‍රීඩා පිටියේ සංවර්ධන කටයුතු වෙනුවෙන් අරමුදල් ලැබෙනු ඇති බවත්, එමෙන්ම සංවර්ධනයට මුදල් නොලැබේය යන ආකල්පයේ නොසිටින බවත්, ඉදිරියේදි පළාත් පාළන ආයතන වලට ලැබෙන ප්‍රතිපාදන මඟින් එම කාර්යයන් කිරීමේ හැකියාව ලැබෙනු ඇති බවත්, පළාත් සභාවේ පසුගිය දිනක තිබූ රැස්වීමකදී  පළාත් පාලන ආයතන පුණ්‍ය ආයතන නොවන බැවින් නොමිලේ සේවා සැපයීම් සිදු කිරීම පිළිබඳව සැලකිලිමත් වන ලෙස දැනුම් දුන් බවත්, පන්සල් වලට අවශ්‍ය කාරණා සඳහා දායක සභාවක් සිටින බවත්, එතුමාද එම දායක සභාවන්වල සිටින බවත්,දැනට නොමිලේ සපයනු ලබන සේවා සියල්ලටම ඉදිරියේදි මුදල් අයකරනු ඇති බවත්ය.

**ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා**

ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා අදහස් දක්වමින්, 2026 වර්ෂයට අදාළව ඉදිරිපත් කළ අයවැයට අදාළව ඉදිරිපත් කළ අදහස් දැක්වීමේදි කෝටි 7 ක් සංවර්ධනයට මුදල් වෙන් කළ බව පැවසූ නමුත්, එම මුදල් සම්පූර්ණයෙන් වියදම් කිරීමක් එම කාලවලදී සිදු වි නොමැති බවත්, මින් පෙර වර්ෂවල ණය පැහැරහැරීම් හේතුවෙන් එම ණය පැහැරහැරීම වෙනුවෙන් මෙම වර්ෂයේදි එක්කෝටි විසිලක්ෂයක් පමණ ගෙවීමට සිදුව ඇති බවත්, මෙම අයවැය තුල කියන තරම් බිල්ලෙක් නොමැති බවත්, ආයුර්වේදයට ඖෂධ මිලදී ගැනීම වෙනුවෙන් ලක්ෂ 36 ක් වෙන්කර ඇති බවත්, සාධනීය අයවැයක් ඉදිරිපත් කර ඇති බවත් පවසමින් එතුමාගේ අදහස් දැක්වීම අවසන් කරන ලදී.

ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒවසන්ත ගුණරත්න මැතිතුමා පැවසූයේ ආයුර්වේදයට ඖෂධ මිලදී ගැනීමට ලක්ෂ 36 ක් වෙන් කර ඇත්තේ සභාවේ සංග්‍රහ වියදම් වලින් කප්පාදු කිරීමෙන් බවයි.ගරු නාගරික මන්ත්‍රී

නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා පැවසුයේ එම ලක්ෂ 36ක මුදලක් වෙන් කර ඇත්තේ ඖෂධ මිලදී ගැනීමට නොව ආයුර්වේද ඔසුසලක් ආරම්භ කිරීමට බවයි.

ගරු නාගරික මන්ත්‍රී ඒම්.නිමල් කරුණාරත්න මැතිතුමා අයවැය සම්බන්ධව බෙදීමක් අවශ්‍ය බවට යෝජනා කරන ලදුව ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා එම යෝජනාව ස්ථිර කරන ලදී. ඒ අනුව 2026 අයවැය සම්මත කර ගැනීම සඳහා පක්ෂව හා විපක්ෂව ඡන්දය ප්‍රකාශ කිරීම වෙනුවෙන් බෙදීමකට යන අතර, විවෘත ඡන්දයක් පැවැත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරන ලෙස ගරු සභාපතිතුමන් විසින් ලේකම්තුමිය වෙත දැනුම් දෙන ලදී.

ඒ අනුව 2026 අයවැය යෝජනාව සඳහා පැවති විවෘත ඡන්ද විමසීම අනුව එකී යෝජනාවට පක්ෂව ගරු සභිකවරුන් 08 දෙනෙකුද, එනම්,

01.ගරු සභාපති කේ. ජී පේමදාස මැතිතුමා
02. ගරු උප සභාපති පේෂල නිකලන්ද මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී නදීශාන් වික්‍රමාරච්චි මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එන්.ඒ.එස් චන්දන මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී ජී.ජී.ජී.එන් සේනාරත්න මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රී එස්.යූ.සී. ජයනක මැතිතුමා
07. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.එම්.එම්.බී.බණ්ඩාර මැතිතුමා
08. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඩී. වසන්ත කුමාර මැතිතුමා

එකී යෝජනාවට විපක්ෂව ගරු සභිකවරුන් 08 දෙනෙකුද , එනම්,

01. ගරු නාගරික මන්ත්‍රී ඩබ්.ඒ.ඩබ්.පී. ගුණරත්න මැතිතුමා
02. ගරු නාගරික මන්ත්‍රී එම්.ටී.එම් රුමී මැතිතුමා
03. ගරු නාගරික මන්ත්‍රී එම්.නිමල් කරුණාරත්න මැතිතුමා
04. ගරු නාගරික මන්ත්‍රී එම්.ජුනයිදීන් මලීක්ෂා මැතිතුමා
05. ගරු නාගරික මන්ත්‍රී එම්.ඩබ්.විමලසිරි මැතිතුමා
06. ගරු නාගරික මන්ත්‍රිනී සුනේත්‍රා ඩී.වීරසිංහ මැතිතුමිය
07. ගරු නාගරික මන්ත්‍රිනී පී.කේ.එන්.ටී.ඩී සමරසේකර මැතිතුමිය
08. ගරු නාගරික මන්ත්‍රී එච්.ඒ.එච්.එන්. හෙට්ටිආරච්චි මැතිතුමා

ලෙස සභිකවරුන් තම ඡන්දය ප්‍රකාශ කළ අතර ඒ අනුව 2026 අයවැය සඳහා ලැබූ ඡන්ද ප්‍රමාණය සම වූ බැවින් ගරු සභාපතිතුමා එකී යෝජනාව සඳහා පක්ෂව තීරක ඡන්දය භාවිතා කිරීමෙන් වැඩි ඡන්ද 01 කින් 2026 අයවැය සභා සම්මත විය.

## 11. අවසානය

අනතුරුව ගරු සභාපතිතුමා අද දින ගරු සභාව වෙත සහභාගී වී අයවැය වෙනුවෙන් පක්ෂව විපක්ෂව ඡන්දය ලබා දුන් සියළු දෙනාටම ස්තූතිවන්ත වන බවත්, තමන්ද මින් පෙර සභාවන් වලදී බොහෝ අවස්ථාවල අයවැය වෙනුවෙන් විපක්ෂව ඡන්දව ප්‍රකාශ කළ බවත්, එය තම තමන් නියෝජනය කරන පක්ෂවලින් සිදුකරන බලපෑම මත සිදුවන බවත්, පක්ෂවලට බැඳියාවක් සෑම මන්ත්‍රීතුමෙකුටම පවතින බවත්, කිසිඳු අයෙකු සැක සංකා තබා නොගන්නා ලෙසත්, ඉදිරියේදී මෙම නගරය මේ තිබෙන තත්වයෙන් තවත් ඉදිරියට ගෙනයාමට තමන්ට වගකීමක් සහ යුතුකමක් පවතින බවත් අනිවාර්යෙන් එය සිදුකරන බවත් ,අදදින සභාව සාර්ථකව පවත්වා ගැනීමට සහයෝගය ලබාදුන් ගරු නාගරික මන්ත්‍රී මණ්ඩලය, කාර්ය මණ්ඩලය සහ මාධ්‍යවේදී කණ්ඩායම සඳහා වෙතද ස්තූතිය පුදකරමින් පෙ.ව.11.17ට පමණ මෙදින විශේෂ මහ සභාවේ කටයුතු අවසන් කරන ලදි.

**කේ. ජී.පේමදාස,**

සභාපති,

බළන්ගොඩ නගර සභාව.